# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2148/9 – 2019 නොවැම්බර් 04 වැනි සඳුදා – 2019.11.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, ගල්ඇටුඹ (අ.ග.පි. 89) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MR/MLT/2017/548 හා 2018.05.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – කලුගහහේන – ප්‍රමාණය: හෙක්. 1.9867**

උතුරට: දයාවංශ වීරබන්ධන දිසානායක හිමිකම් කියන එගොඩකනත්තහේන, මොහොට්ටි ආරියදාස හිමිකම් කියන පිටකොරටුව සහ ටී. ප්‍රැන්සිස් හිමිකම් කියන අඹගහකුට්ටිය පිටකොරටුව; නැගෙනහිරට: මොහොට්ටි ආරියදාස හිමිකම් කියන පිටකොරටුව සහ ටී. ප්‍රැන්සිස් හිමිකම් කියන අඹගහකුට්ටිය පිටකොරටුව; දකුණට: ටී. ප්‍රැන්සිස් හිමිකම් කියන අඹගහකුට්ටිය පිටකොරටුව සහ අබේසිරිනාරායන වනිගරත්න නන්දසිරි සහ තවත් අය හිමිකම් කියන කලුගහහේන; බටහිරට: දෙයියන්දර හඳුගල මාර්ගය (මා.සං.අ.) සහ දයාවංශ වීරබන්ධන දිසානායක හිමිකම් කියන එගොඩකනත්තහේන.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/වීඊ/506.
2019 සැප්තැම්බර් මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 1250